සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

43 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2016

**Third Term Test - Grade 13 - 2016**

විභාග අංකය .............................

## ක්‍රිස්තු ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

(01) i. ද්විතීය සම්මත ග්‍රන්ථ අනුමත නොකළ සභා පියවරු හතර දෙනෙක් නම් කරන්න.

ii. පැරණි ගිවිසුමේ පාස්කු ජන වන්දනාවේ සිදු කළ ප්‍රධාන අංග හතර නම් කරන්න.

iii. දිවැසිවරු ගිවිසුම් සංකල්පය පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රධාන සංකල්ප හතරක් ලියා දක්වන්න.

iv. ජේරුසලම් මන්ත්‍රණ සභාවේ දී ගත් තීරණ හතරක් ලියා දක්වන්න.

v. සභා ආරක්ෂක භාරය හෙවත් පදෝ ආදෝ සැලැස්ම යටතේ පැවරුණු බලතල හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

(02) ii. මාක් සුවිශේෂයට ආවේනික ලක්ෂණ හතරක් නම් කරන්න.

ii. ජොහාන් සුබාරංචිය සම්පාදනය වීමේ දී ඇසුරු කර ගත් මූලාශ්‍ර පිළිබඳ මත හතරක් ලියා දක්වන්න.

iii. කුරුසපත් ව සිටි ජේසුස් වහන්සේට අපහාස කළ පුද්ගල කණ්ඩායම් හතරක් නම් කරන්න.

iv. එකොලොස්වන සියවසේ දී සභාව තුළ හත්වන වන ග්‍රෙගරි පාප් තුමන් විසින් ඇති කරන ලද ප්‍රතිසංස්කරණ හතරක් නම් කරන්න.

v. පුනරුද සමයේ සභා ප්‍රතිසංස්කරණය සඳහා දායක වූ තාපස නිකායන් හතරක් නම් කරන්න. (ලකුණු 4 x 5 = 20)

(03) i. ඉශ්‍රායෙල් රාජ්‍ය පාලන සමයේ සිදු වූ විශේෂ සිදුවීම් හතරක් ලියන්න.

ii. පංච පුස්තකය තුළ දක්නට ලැබෙන ඉතා වැදගත් දේව ධාර්මික තේමා හතරක් ලියා දක්වන්න.

iii. ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණීම හේතුකොට ගෙන කිතු දහම වැළඳගත් රජදරුවන් හතර දෙනෙකු නම් කරන්න.

iv. නිදහසින් පසු සභාව මුහුන දුන් ගැටලු හතරක් ලියා දක්වන්න.

v. මුල් යුගයේ කිතුණු ලේඛකයෙකු සහා පියෙකු වශයෙන් නම් කිරීමේදී සළකා බැලිය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 4 x 5 = 20)

## II කොටස

(04) i. දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව සමග ඇතිකර ගත් සිනයි ගිවිසුම පිළිබඳ ව පහත කරුණු ඔස්සේ විස්තර කරන්න.

- ගිවිසුමට සූදානම් - ගිවිසුම ප්‍රකාශ කිරීම - ගිවිසුම ස්ථිර කිරීම.

ii. "දස පනත" වත්මන් කිතුනු ජීවිතය හැඩ ගස්වා ගැනීමට මාර්ගෝපදේශය සපයන ආකාරය වචන 120 කින් පමණ පැහැදිලි කරන්න. (ලකුණු 10x 2 = 20)

(05) i. දේව රාජ්‍යය ගැන දේශනා කිරීමේ දී ක්‍රිස්තුන් වහන්සේ යොදා ගත් සරළ උපමා තුනක් ඇසුරින් දේව රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ ව වචන 120 කින් පමණ අදහස් දක්වන්න.

ii. මතෙව් සුභාරංචියේ සඳහන් කන්ද උඩ දේශනාව ඇසුරින් දේව රාජ්‍ය පිළිබඳ ව ක්‍රිස්තුන් වහන්සේ කළ ඉගැන්වීම් පහක් ඔබේ ජීවිතයට අනුසාර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10x 2 = 20)

(06) i. ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුළුවරුන්ගේ පාද දෝවනය කළ අවස්ථාව හඳුන්වා එමගින් ඉස්මතු වන ගැඹුරු අරුත කරුණු හතරකින් පැහැදිලි කරන්න.

ii. සභා ඉතිහාසයේ "ස්වර්ණමය යුගය" ලෙස හැඳින්වෙන ශුද්ධ වූ සභාවේ ආරම්භයේ පටන් මුල් සියවස් තුනක කාලය තුළ සභාවේ වර්ධනය හා ව්‍යාප්තිය පිළිබඳ ව මූලික කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10x 2 = 20)

(07) i. ජගත් මන්ත්‍රණ සභා අතර වැදගත් තැනක් ගන්නා නයිසීන මන්ත්‍රණ සභාව පිළිබඳ ව එය කැඳවීමට මුල් වූ වේද භේදික මත හා එහිදී ගත් තීරණ ඇසුරින් විග්‍රහයක යෙදෙන්න.

ii. මුල් කිතුනු ලේඛකයන් හෙවත් සභා පියවරුන් සභා වර්ධනයට දායක වූ ආකාරය සභා පිය චරිත දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10x 2 = 20)

(08) i. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ බලපෑම් අනුව ජන වන්දනාව තුළ ප්‍රතිසංවිධාන රැසක් ඇති විය. එමගින් ශ්‍රී ලංකා සභාවේ ඇති වූ නවෝදය කරුණු පහක් මගින් විස්තර කරන්න.

ii. ලන්දේසීන්ගේ පාලන යුගය මෙරට කතෝලිකයන්ට පීඩන සමයක් වුව ද ලන්දේසි පාලන සමය ශ්‍රී ලංකාවේ ප්‍රගතියට මහත් සේ දායක වූ බව කරුණු පහක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 10x 2 = 20)